**යාපනය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

-----------------------------------------------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

යාපනය විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා

ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ----------------------------------- | ------------------ |
| (අ) | රු. 582,273 ක් වූ ජංගම නොවන වගකීම්වල වෙනස්වීම්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව, මෙහෙයුම් කටයුතුවලින් ලැබෙන මුදල් ප්‍රවාහය ඒ හා සමාන වටිනාකමකින් අඩුවෙන් දක්වා තිබුණි. | රු. 582,273 ක වටිනාකම මෙහෙයුම් කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහයට ප්‍රමාද දෝෂයකින් ඇතුළත් කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී නිසි සැලකිල්ලක් දැක්වීමට සටහන් කර ගන්නා ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කිරීම |
| (ආ) | වාහන, උපකරණ සහ වෙනත් දේ පුනරුත්ථාපනය කිරීම සඳහා දරන ලද රු. 25,027,908 ක් ජංගම නොවන වත්කම් යටතේ ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, ගොඩනැගිලි වටිනාකම ඒ හා සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. | වාහන, උපකරණ සහ කෙරෙමින් පවතින වෙනත් දෑ පුනරුත්ථාපනය කිරීම සඳහා දරන වියදම් සඳහා වෙනම ලෙජර ගිණුම් පවත්වාගෙන ගොස් තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේදී ඒවා ගොඩනැගිලි යටතේ පෙන්වා ඇත. අනාගතයේදී වෙනම වත්කම් කාණ්ඩයක් යටතේ පුනරුත්ථාපන කටයුතු පෙන්වීමට නිවැරදි ක්‍රියාමාර්ග ගෙන ඇත. | ගොඩනැගිලි වටිනාකම වෙනම පෙන්විය යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණනයට ලබා දී ඇති තොරතුරු වලට අනුව, රු. 53,184,556 ක් වටිනාකමැති පුස්තකාල පොත් පිළිබඳ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය වසර 30 කට වැඩි කාලයක් තුළ විශ්ව විද්‍යාලයේ කළමනාකාරිත්වය විසින් සිදු කර නොතිබුණි. | වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය සම්පූර්ණ කිරීමට පියවර ගෙන ඇත. කණ්ඩායම් සාමාජිකයින් විසින් සෑම පොතක්ම සත්‍යාපනය කර හඳුනා ගැනීම සලකුණු කර ඇත. විවිධ ස්ථානවල පොත් සහ වාර සඟරා 250,000 කට වඩා අධික ප්‍රමාණයක් පවතී. | සමීක්ෂණ මණ්ඩලය නිතිපතා පැවැත්විය යුතුය . |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්‍රාමික කාර්ය මණ්ඩලයෙන් අයවිය යුතු වසර 5 කට වැඩි ආපදා ණය ශේෂය රු. 859,291 ක් වූ අතර, එම හිඟ මුදල් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන මූලා ප්‍රකාශනවල ලැබිය යුතු ගිණුම් යටතේ පෙන්වා තිබුණි. | වැටුප් රහිත නිවාඩු, තනතුරේ නිවාඩු, සේවා කාලය අවසන් කිරීම, සේවයෙන් විශ්‍රාම ගැනීම යනාදිය හේතුවෙන් ඇතැම් ණය වසර 5 ඉක්මවා තිබුණි. කෙසේ වෙතත්, යූපීඑෆ් අරමුදල නිදහස් කිරීමේදී එය සේවක අරමුදලෙන් අය කර ගැනීමට අවශ්‍ය පැහැදිලි පාලනයක් හා ක්‍රියා පටිපාටියක් ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට නිසි පියවර ගැනීම. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සිසුන්ගෙන් අයකරගත් එකතුව | ආපසු ගෙවිය යුතු තැන්පතු වහාම අදාළ සිසුන්ට | ගැටළුව නිවැරදි |

| | | |
|---|---|---|
| රු. 166,500 ක ආපසු ගෙවිය හැකි තැන්පතු තුනක් අවුරුදු හතකට (7) වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ආපසු ලබා දීම සඳහා පැහැදිලි යාන්ත්‍රණයක් අප සකස්කර ඇත. පාඨමාලාව සම්පූර්ණ කළ කාල සීමාවේ සිට වසර 5 ක් ඇතුළත අදාළ ශිෂ්‍යයා ආපසු ගෙවිය යුතු තැන්පතුව ඉල්ලා නොසිටියේ නම්, එය විශ්ව විද්‍යාල සංවර්ධන අරමුදලට මාරු කිරීමට අපි පියවර ගෙන ඇත. | කිරීම සඳහා සුදුසු පියවර ගැනීම. |
| (ආ) අධිකරණය විසින් දුන් නියෝගයකට ප්‍රතිචාර වශයෙන්, වර්ෂ 18 ක කාලයක් ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් පොලිය වශයෙන් රු. 344,560 ක්ද ඇතුළුව වැඩ බලන තනතුරේ වැටුප ලෙස රු. 470,650 ක් හිටපු සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකුට 1998 දී ඔහු විශ්‍රාම යන අවස්ථාවේදී ගෙවීමට විශ්ව විද්‍යාලයට සිදුවී තිබුණි. | මෙය ඔහුගේ සහකාර වැටුප වෙනුවෙන් විශ්වවිද්‍යාලයට එරෙහිව හිටපු සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් 1998 දී දිස්ත්‍රික් උසාවියේ ගොනු කරන ලද නඩුවකි. නඩුව සඳහා තීන්දුව ලබා දී ඇත්තේ 2017 දී වන අතර, අධිකරණයේ තීන්දුව සහ සභාවේ අනුමැතිය මත පදනම්ව, 2018 දී හිටපු සහකාර රෙජිස්ට්‍රාර්වරයා වෙත බේරුම් කිරීම කරන ලදී. | කළමනාකරණ විසින් මෙවැනි අවස්ථා නැවත ඇති නොවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතියක අරමුදල්වලින් විශ්වවිද්‍යාල නිලධාරියෙකුට අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු. 100,000 ක මුදල වසර 5 කට අධික කාලයක් තිස්සේ නිරවුල් කර නොතිබූ අතර, එය මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ විවිධ අත්තිකාරම්, සැපයුම් අත්තිකාරම්, ගමන් වියදම් අත්තිකාරම් සහ සුළු මුදල් අත්තිකාරම් වශයෙන් නිලධාරීන් වෙත ගෙවන ලද එකතුව රු. 476,135 ක් වූ අත්තිකාරම් 2019 ජුනි 30 දක්වාම නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම කිසිදු ප්‍රමාදයකින් තොරව පියවීමට පියවර ගනු ලැබේ. අදාළ කාර්ය මණ්ඩලය අත්තිකාරම් නිරවුල් කිරීමට අපොහොසත් වුවහොත්, ඒවා වැටුපෙන් අයකර ගැනීමේ ක්‍රියාවලිය වහාම සිදු කරනු ලැබේ. | අත්තිකාරම් ලබා දී ඇති කාර්යය අවසන් වූ වහාම එය පියවීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 267 | අවස්ථා 9,432 කදී ඔවුන්ගෙන් රිසිට්පත් ලබා නොගෙන විශ්වවිද්‍යාල සේවකයින්ට වැටුප් ගෙවා තිබුණි. | විකල්ප පිළිබඳ අවධානය යොමු කරමින් දීර්ඝ ලෙස මෙ සාකච්ඡා කර ඇත. සියලුම දෙපාර්තමේන්තු වෙත වැටුප් පත්‍රිකා යැවීමට සහ කිසිදු ප්‍රමාදයකින් තොරව මාසිකව අත්සන ලබා ගැනීමට දැන් පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 272 (3) | සියලුම ගෙවූ වවුචර ඒවාට අදාළ මාසය අවසානයේ සිට සති හයකට නොවැඩි කාලයක් ඉකුත් වීමට මත්තෙන් විගණකාධිපති වෙත මසක් පාසා යැවිය යුතු වුවද, එම වවුචර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවීම සිදුකළ විගසම විගණක විසින් ඉල්ලීමක් කළ සෑම අවස්ථාවකදීම වවුචර් විගණනයට ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී මාසිකව වවුචර ඉදිරිපත් කිරීමට අපි පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූල විය යුතුය. |
| (iii) මුදල් රෙගුලාසි 371 (5) | සේවකයින් සඳහා අත්තිකාරම් ගෙවීම් 198 න් 182 ක් නියමිත දිනට පියවා නොතිබූ අතර, ප්‍රමාද වීමේ කාලය මාස 3 සිට 10 දක්වා පරාසයක පැවතුනි. | කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් පියවීමට අපි දැඩි පියවර ගෙන ඇත. නොවිසඳුණු අත්තිකාරම් අධීක්ෂණය කිරීම සඳහා සමීප අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇති අතර, කිසියම් පැහැර හැරීමක් සිදු වූ විට ඒවා අදාළ පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට | කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් පියවීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පියවර ගෙන තිබේ. | |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) 2003 ජුනි 02 දිනැති අංක PED/12 හි 6.5.3 ඡේදය | 2017 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව 2019 ජුනි 20 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | වසර 2017 සඳහා වාර්ෂික වාර්තාව හා විශ්වවිද්‍යාලයේ ගිණුම් දැනටමත් 2019 ජුනි 28 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය . |
| (ii) 2005 ජුලි 01 දිනැති අංක PED/31 | සෑම කාර්තුවකම අවම වශයෙන් එක් රැස්වීමක්වත් පැවැත්විය යුතු වුවද, විගණන කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂයේ සිව්වන කාර්තුවේදී පවත්වා නොතිබුණි. | 2018 වර්ෂය තුළ අප විගණන කමිටු රැස්වීම් 5 ක් පවත්වා ඇත. සහකාර අභ්‍යන්තර විගණක පත්කිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2018 වර්ෂයේ අවසාන කාර්තුව සඳහා විගණන කමිටු රැස්වීමක් පැවැත්වීමට අපට නොහැකි විය. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. |

**(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| (i) 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන ආයතන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා වූ විශ්වවිද්‍යාලයේ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය මාස 6 කට වඩා වැඩි කාලයක් ප්‍රමාද කර ඇත. | පහත සඳහන් හේතුන් මත වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය මාස හයකට වඩා වැඩි කාලයක් ප්‍රමාද ඇත. අධ්‍යයන කටයුතු අඛණ්ඩව සිදු වෙමින් පවතී. 2018 වර්ෂයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම වෘත්තීය සමිති ක්‍රියාමාර්ග. ඉදිරියේදී සමීක්ෂණ මණ්ඩලය නියමිත වේලාවට පැවැත්වීම සහතික වීමට පියවර ගෙන තිබේ . | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 2017 ජුලි 10 දිනැති අංක 10/2017 දරන ආයතන චක්‍රලේඛය. | ඇඟිලි සළකුණු යන්ත්‍රය හරහා ඔවුන්ගේ පැමිණීම සහ පිටවීම තහවුරු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයට රු. මිලියන 1,403.8 ක් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාන්‍යයෙන් පැමිණීමේ ලේඛනයේ අත්සන් තැබීමක් සිදු නොකෙරේ. කෙසේ වෙතත්, 2012.09.29 දිනැති කවුන්සිලයේ 372 වන රැස්වීමේදී මෙම කරුණ අවධානයට ලක් කරන ලද අතර, ලෝකයේ කිසිදු තැනක අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීමේ ලේඛනයට අත්සන් කිරීමට අපේක්ෂා නොකරන බව රැස්වීමේදී පෙන්වා දෙන ලදී. පීඨාධිපතිවරු මෙය අනුමත කරන ලදී. එසේම, අධ්‍යයන දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඔවුන්ගේ පැමිණීම සනාථ කරමින් සිටින අතර, එය සෑම විටම අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අධීක්ෂණය කරනු ලැබේ. මීට පෙර පැවති කෝප් රැස්වීමේදී ද මෙය පිළිගන් ලදී. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල විය යුතුය. |
| (iii) 2017 ජුලි 10 දිනැති අංක 10/2017 දරන ආයතන චක්‍රලේඛය | ඇඟිලි සළකුණු පැමිණීම තුළින් ඔවුන්ගේ රාජකාරි කාලය තහවුරු කිරීමකින් තොරව රු. 5,480,177 ක් අතිකාල දීමනා ලෙස සේවකයින්ට ගෙවා තිබුණි. | සියළුම සේවකයින් සඳහා ඇඟිලි සළකුණු පද්ධතියක් නොතිබීම හේතුවෙන් අතින් සටහන් කරනු ලබන පැමිණීම මත පදනම්ව මීට පෙර අතිකාල ගෙවා ඇත. චක්‍රලේඛයට අනුව අතිකාල ගෙවීම සඳහා දැනට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත . | ඇඟිලි සළකුණු මුද්‍රණ පැමිණීම තුළින් අතිකාල පැය ගණන තහවුරු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 717,788,058 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 443,649,262 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 274,138,796 ක පිරිහීමක්

නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පුද්ගලික පඩිනඩි, භාවිතා කරන ලද සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය, නඩත්තු පිරිවැය සහ කොන්ත්‍රාත් සේවා වැඩි කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතිකාල දීමනා අඩු කිරීමේ අරමුණින් ආරක්ෂක නිලධාරීන්ගේ පුරප්පාඩු 2017 අප්‍රේල් 05 දින පුරවා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ආරක්ෂක නිලධාරීන් සඳහා ගෙවන අතිකාල දීමනා පෙර වර්ෂය හා සසඳන විට රු. 2,500,174 ක් හෙවත් සියයට 24 කින් ඉහළ ගොස් තිබුණි. | දැනට දැනට විශ්වවිද්‍යාලවල ආරක්ෂක කාර්ය මණ්ඩලය 53 ක් පමණක් ඇති අතර, මෙම කාර්ය මණ්ඩලය ධාරිතාවය සමස්ත විශ්වවිද්‍යාලයටම ප්‍රමාණවත් නොවේ. එබැවින් විශ්වවිද්‍යාල ආරක්ෂක කාර්ය මණ්ඩලය අතිකාල වැඩ කිරීම වැදගත් වේ. ආරක්ෂක සේවාව වැළැක්විය නොහැකි අතර, එය කිසිදු විවේකයක් නොමැතිව ලබා දිය යුතු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස අතිකාල ගෙවීම් වැඩි වේ. කෙසේ වෙතත්, කාර්යමණ්ඩල අවශ්‍යතාවය වැඩි කිරීමට කළමනාකරණය දැනටමත් පියවර ගෙන ඇත. | අවශ්‍යතාවයට අනුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය ඉහළ නැංවිය යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 289,600 ක පරිගණක හා බහු මාධ්‍ය පාඩුව වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් පියවා ගැනීම සඳහා පාලක මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබුණද, එම පාඩුව පියවා ගැනීම සඳහා විශ්වවිද්‍යාල කළමනාකාරිත්වය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පරිගණකවලට අදාළ රු. 190,900 ක පාඩුව දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් අයකර ගැනීමට පාලක මණ්ඩලය තීරණය කර ඇත. මෙම පාලක මණ්ඩලයේ තීරණයට ඔහු එකඟ නොවූ හෙයින්, මෙම කාරණය මණ්ඩලය විසින් නීති කටයුතු පිළිබඳ කාරක සභාවට යොමු කර ඇත. නීති කටයුතු කමිටුවේ උපදෙස් අනුව අවශ්‍ය පියවර ගනු ලැබේ. | අලාභය පියවා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| | නැතිවූ බහුමාධ්‍යයේ වටිනාකම අයකර ගැනීමට පාලක මණ්ඩලය තීරණය කළ අතර කළමනාකරණය මේ සම්බන්ධයෙන් වගකිවයුතු තැනැත්තාට දැනටමත් එකඟතා ලිපිය යවා ඇත. එකඟතා ලිපිය ලැබුණු වහාම අදාළ කාර්ය මණ්ඩලයෙන් එම මුදල අය කර ගැනීමට පියවර ගනු ලැබේ. | |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශිෂ්‍යත්ව වැඩසටහන් සඳහා විදේශගත වූ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනූඑකක් (91) රාජකාරි සඳහා වාර්තාකර හෝ ශිෂ්‍යත්ව අවසන් වීමෙන් පසු විශ්වවිද්‍යාලයෙන් පිටව ගොස් හෝ නොතිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 68 ක බැඳුම්කර මුදල 1987 සිට 2019 දක්වා කාලය තුළ ගිවිසුම් උල්ලංඝනය කළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බැඳුම්කර හා ගිවිසුම් පිළිබඳ කාරක සභාව හරහා බැඳුම්කර බැඳීම වැඩි දියුණු කිරීම සඳහා පාලක මණ්ඩලයේ උපදෙස් පරිදි විවිධ ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය කාලය තුළ පැහැර හරින ලද සංඛ්‍යාව සහ හිඟ මුදල විශාල වශයෙන් අඩු කර ඇත. දැනට බැඳුම්කරුවන් 91 ක් විසින් නිරවුල් කළ යුතු මුළු බැඳුම්කර මුදල රු. මිලියන 68 කි. බැඳුම්කර හා ගිවිසුම් පිළිබඳ කාරක සභාවේ රැස්වීම ඒවා අඛණ්ඩව සමාලෝචනය කරමින් සිටි අතර, අනාගතයේ දී බැඳීම අවම කිරීම සඳහා නීතිමය අවශ්‍යතා සෝදිසි කිරීම සඳහා වන සියලු ක්‍රියා පටිපාටි | ගැටළුව නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග විශ්වවිද්‍යාල කළමනාකාරිත්වය විසින් ගත යුතුය. |

| | | |
|---|---|---|
| | කේතනය කරමින් මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති පත්‍රිකාවක් සකස් කර තිබුණි. | |
| (ආ) ඉකුත් වර්ෂවලදී වැය කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 9,328 ක් වටිනා වාර සඟරා 2019 මැයි 31 දක්වා විශ්වවිද්‍යාලය වෙත ලැබී නොතිබුණි. | පසුකාලීන ජර්නල් ගෙවීම් පාලනය කිරීම සඳහා පාලන යාන්ත්‍රණය දැනටමත් වේගවත් කර ඇත. වසර දෙකක කාල සීමාව තුළ වාර සඟරා සැපයීමට සැපයුම්කරු අපොහොසත් වුවහොත් පසුකාලීන ජර්නල් ගෙවීමෙන් ජර්නල් වටිනාකම අඩු කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. | වාර සඟරා කාලීනව ලබා ගැනීම සඳහා පියවර ගත යුතුය. |
| (ඇ) ලෝකයේ ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත ආයතනයක් විසින් ප්‍රකාශයට පත්කරන ලද විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව, සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල අතර මෙම විශ්වවිද්‍යාලය 8 වන හා 4,384 ස්ථානය ලබාගෙන ඇත. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් අනුව 4,560 ස්ථානයේ සිට ඉහළ ගොස් තිබුණද, පසුගිය වසරට සාපේක්ෂව දේශීය ශ්‍රේණිගත කිරීම 7 වන ස්ථානයේ සිට පහත වැටී තිබේ. | පවත්වාගෙන ගොස් ඇති පරිදි යාපනය විශ්වවිද්‍යාලය 2017 වසරේ 7 වන ස්ථානයට පත්ව සිටියද, එය 2018 දී 8 වන ස්ථානයට පත්වී යළිත් 2019 දී 7 වන ස්ථානයට පත්විය. 2018 වසරේ ශ්‍රේණිගත කිරීම් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීමට භාවිතා වන Webometrics විද්‍යුත් ගබඩාවට අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කිරීම් හෝ යාවත්කාලීන කිරීම වේ. | විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම. |
| (ඈ) විශ්වවිද්‍යාලය විසින් උපාධි සහතික සමග නිකුත් කරනු ලබන තහවුරු කිරීමේ ලිපිවල ශිෂ්‍යයන් විසින් හදාරනු ලබන පාඨමාලාවේ මාධ්‍ය සඳහන් කර නොතිබුණි. එමනිසා, එම ලිපිවල ඇති මූලික තොරතුරු නොමැති වීම හේතුවෙන් එවැනි තහවුරු කිරීමේ ලිපි අදාළ ආයතන විසින් ආපසු යවා ඇති බව අවස්ථා කිහිපයකදී නිරීක්ෂණය විය . | සෙනෙට් සභාවේ අනුමැතිය ඇතිව උපාධි ප්‍රකාශයේ මාධ්‍ය ඇතුළත් කිරීමට පියවර ගනු ලැබේ. කෙසේ වෙතත්, වර්තමානයේදී, පාඨ මාලාවේ අවසානයේ උපාධිධාරීන්ට නිකුත් කරනු ලබන අධ්‍යයන පිටපතෙහි උපදෙස් මාධ්‍යය දක්වා ඇත. | පාඨමාලාවේ මාධ්‍යය උපාධි ප්‍රකාශයේ සඳහන් කිරීම අවශ්‍යා වේ. |
| (ඉ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුන තුළදී රු. 43,577,638 ක් විශ්වවිද්‍යාලය | 2017 සහ 2018 වර්ෂය සඳහා කරන ලද පර්යේෂණවල අවසන් වාර්තාව දැනට | පර්යේෂකයන් විසින් ඔවුන්ගේ |

| | | |
|---|---|---|
| විසින් පර්යේෂකයන්ට ගෙවා ඇත. ඉහත පර්යේෂණවල ප්‍රක්ෂේපිත කාලසීමාව අවසන් වී ඇති අතර, පර්යේෂණ පිරිවැයෙන් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් මේ වන විටත් ගෙවා ඇතත්, ඒවායේ ප්‍රගතිය සහ එම පර්යේෂණවල අවසන් වාර්තා සමාලෝචිත වර්ෂය අවසානය තෙක් පර්යේෂකයන් විසින් විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරිපත් කරමින් පවතී. | අවසාන වාර්තා නියමිත පර්යේෂණ කාලය තුළ ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) 2017 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, එම සමීක්ෂණ මණ්ඩල කමිටුව විසින් 2018 දී ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වර්ග 403 සම්බන්ධයෙන් සමීක්ෂණය කර නොතිබුණි. | වත්කම් වෙනස්වීම්වලට අදාළ ඉන්වෙන්ටරි ලේඛනය සමතුලිත කිරීමට, අදාළ ලියකියවිලි තබා ගැනීමට හා නඩත්තු කිරීමට සියළුම සහායක කාර්ය මණ්ඩලයෙන් (එම්ඒ) ඉල්ලා ඇත. ඊළඟ මණ්ඩල සමීක්ෂණයට පෙර සභාව විසින් අනුමත කරන ලද වෙන්දේසි කරන ලද අයිතම ඉවත් කරනු ලැබේ. | කොමිෂන් චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයට අනුව, විභාගයෙන් පසු මාස තුනක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතුය. කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයට යටතේ පවත්වනු ලබන පාඨමාලාවලට අදාළ විභාග දිනයන් සහ ප්‍රතිඵල නිකුත් කිරීමේ ඉලක්කගත දිනයන් කලින් තීරණය කර නොතිබුණි. ප්‍රතිඵල නිකුත් කිරීමේ සැළකිය යුතු ප්‍රමාදයන් එනම්, 2018 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ පීඨ කිහිපයක් විසින් මාස 02 සිට 11 දක්වා කාලයක ප්‍රමාදයන්, තවදුරටත් පවතින බව නිරීක්ෂණය විය. | පූර්ව ප්‍රතිඵල මණ්ඩලයේ නිර්දේශය මත බොහෝ විභාග ප්‍රතිඵල නිකුත් කර ඇති අතර, අවසාන ප්‍රතිඵල දෙවන වාරයේ/ වාර්ෂික පදනම සමඟ මුද්‍රාහරිනු ඇත. පීඨාධිපතිවරුන්ට සිහි කැඳවීම් සහ "ප්‍රතිඵල නිකුත් කිරීමේ තත්ත්වය" පිළිබඳ මාසික වාර්තා සෙනෙට් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් විභාග ප්‍රතිපල නිකුත් කිරීමේ ප්‍රමාදය අඩු කිරීමට පියවර ගෙන තිබේ. | චක්‍රලේඛ උපදෙස් අනුව විභාග ප්‍රතිපල මාස තුනක් ඇතුළත නිකුත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේදී න්‍යායාත්මක හා ප්‍රායෝගික දේශන සඳහා වෙන් කර ඇති පැය 12,660 න් පැය 2,380 ක් දෙමළ, ලලිත කලා, සමාජ විද්‍යාව, මානව සම්පත් කළමනාකරණය, ගිණුම්කරණය, මූල්‍ය කළමනාකරණය සහ වාණිජ යන අංශවල අධ්‍යයන කථිකාචාර්යවරුන් විසින් භාවිතා කර නොතිබුණි. | භාවිතයට නොගත් පැය විශ්වවිද්‍යාල සිසුන්ගේ අධ්‍යාපනයට හා පාඨමාලාවේ ප්‍රමිතීන්ට බලපාන්නේ නැති බව සහතික විය හැක. | අධ්‍යයන කථිකාචාර්යවරුන් කාලසටහනට අනුව අධ්‍යයන දේශන පැවැත්වීම අවශ්‍ය වේ. |

## 3.5 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩ හතරකට අදාළවරු. 1,990,474 ක් වූ නොගෙවූ ශේෂ වසර 8 කට වැඩි කාලයක් තිස්සේ අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ සීමිත අරමුදල් සහ නිශ්චිත සංචිත ලෙස පෙන්වා තිබුණි. | යාපනය විශ්ව විද්‍යාලය විවිධ අරමුණු සඳහා විවිධ සුභ පැතුම් වෙතින් අරමුදල් ලබා ගනී. අදාළ ලෙජර ගිණුම්වලට බැර කරන ලද මුදල් අපට ලැබුණු විට සහ එම අරමුදල් කෙටි කාලීන ආයෝජන පදනම මත ස්ථාවර තැන්පතුවල තබනු ලැබේ. අදාළ ආයෝජනයෙන් උපයන පොළිය සැලකිල්ලට ගෙන එවැනි සිදුවීමක් සිදු වූ විට පරිත්‍යාගශීලීන් විසින් දක්වා ඇති විශේෂිත අරමුණු සඳහා යොදා ගනී. පරිත්‍යාගශීලියා විශේෂ කාර්යයන් කිසිවක් උපදෙස් දී නැති නිසා රු. 1,990,474 ක් වූ මෙම අරමුදල කිසිදු නිශ්චිත කටයුත්තක් සඳහා තවමත් භාවිතා කර නොමැත. පරිත්‍යාගශීලියාගෙන් උපදෙස් ලැබුණු වහාම අපි එය භාවිතා කිරීමට පියවර ගන්නෙමු. | කිසිදු ප්‍රමාදයකින් තොරව අපේක්ෂිත අරමුණු සඳහා අරමුදල් භාවිතා කිරීම. |

## 3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කළමනාකරණ පීඨයේ කාණ්ඩ ඒ (අදියර 1) කොන්ත්‍රාත්තුව අවසන් කරන විට රු. 574,264 ක් වූ ඉදිකිරීම් ද්‍රව්‍ය තොගයක් කොන්ත්‍රාත්කරු විසින් 2015 දී විශ්වවිද්‍යාලයට භාර දී තිබූ අතර, සහ එම කොන්ත්‍රාත්තුව 2017 දී නව කොන්ත්‍රාත්කරුවෙකුට නැවත ප්‍රදානය කරන අවස්ථාවේදී එම ඉදිකිරීම් ද්‍රව්‍ය නැති වී තිබුණි. | අපගමනය සඳහා ප්‍රධාන හේතුව ද්‍රව්‍ය මැනීමේදී ගණනය කිරීමේ දෝෂයකි. මිනුම් වැරදියි ගණනය කිරීමේදී ඇතැම් ද්‍රව්‍යමය භාණ්ඩ රැගෙන යනු ලැබේ. භාණ්ඩ ගණනය කිරීම සඳහා යොදාගෙන ඇති ඇතැම් මිනුම් නිවැරදි නොවේ. මිනුම් වාර්තාව නිවැරදි කිරීමට පියවර ගෙන ඇති අතර එය හැකි ඉක්මනින් නිවැරදි කරනු ලැබේ. | මිනුම් සහ ගණනය කිරීම් වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය . |
| (ආ) රු. මිලියන 88.3 ක වියදමකින් ඉදිකරන ලද තට්ටු 3 ක ගොඩනැගිල්ලක කයිතඩි සිද්ධ වෛද්‍ය ඒකකය පිහිටුවා තිබුණි. එම ඉදිකිරීම් වියදම තුළ බිල්පත් පියවීම ප්‍රමාද වීම හේතුවෙන් ඉදිකිරීම් සමාගමට පොලිය සහ පොලිය මත පොලිය වශයෙන් රු. 4,282,910 ක් ගෙවා තිබුණි. පෙබරවාරි 2019 දී පවත්වන ලද විගණන පරීක්ෂණ අනුව, එම ගොඩනැගිල්ලේ ඇති රසායනාගාර 3 ක් සහ කාමර 3 ක් ඇති අතර, ඉන් අපේක්ෂිත අරමුණු සඳහා යොදාගෙන තිබුණේ රසායනාගාර 2 ක් පමණක් බව නිරීක්ෂණය විය. | සම්පූර්ණ කරන ලද තෙමහල් ගොඩනැගිල්ලේ, අපට විද්‍යාගාර 3 ක්, දේශන ශාලා 2 ක් සහ ලොබිය සහිත කාමර 3 ක් ඇත.<br><br>දේශන ශාලා දෙකක් සහ විද්‍යාගාර තුනක් 2017 ජනවාරි සිට භාවිතා වේ. අනෙක් කාමර 2019 සිට පරිපාලන කාර්යාලය, සම්බන්ධීකාරක කාර්යාලය සහ නඩත්තු ඒකකයේ කාර්යාලය සහ සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා යොදා ගැනේ. | අපේක්ෂිත අරමුණු සඳහා ගොඩනැගිල්ල ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය. |
| (ඇ) රු. මිලියන 192.36 ක වියදමින් ඉදිකර කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයට භාරදී ඇති ගොඩනැගිල්ලක් වසර 3 කට වැඩි කාලයක් කිසිදු | සී බ්ලොක්හි ගොඩනැගිල්ලෙහි වැඩ නිම කර ඇතත්, අනෙකුත් ගොඩනැගිලි (ඒ, බී, ඩී සහ ඊ) සම්පූර්ණ කර නොමැති අතර, | ගොඩනැගිල්ල අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගත යුතුය . |

| | | |
|---|---|---|
| ආර්ථික කටයුත්තක් සඳහා යොදා ගෙන නොතිබුණි . | කොන්ත්‍රාත්තුව නවතා නැවත දැන්වීම් පලකිරීමට සිදුවීම හේතුවෙන් එය නිම කිරීමට බොහෝ කාලයක් ගත විය. මේ අතර, සී ගොඩනැගිලි කොටස කලා පීඨයේ වෙනත් දේශන කටයුතු සඳහා යොදා ගන්නා ලදී. දැනට “සී” බ්ලොක් සහ බ්ලොක් “ඩී සහ ඊ” විශ්වවිද්‍යාලය විසින් සම්පූර්ණ කර පවරා ගෙන ඇත. “A” කොටස මෙතෙක් සම්පූර්ණ කර නැත. කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය 2019.10.15 වන විට ආශ්‍රිත කටයුතු අවසන් වූ පසු නව ස්ථානයට ගෙන යනු ලැබේ. | |
| (ඇ) නිෂ්ක්‍රීය, භාවිතයට ගත නොහැකි සහ සෙමින් චලනය වන භාණ්ඩ පිළිවෙලින් රු. 162,431, රු. 362,695 ක් සහ රු. 175,188 ක් කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගෙන වසර 04 සිට 20 දක්වා කාලයක් විශ්වවිද්‍යාල ගබඩාවල අක්‍රියව පැවතුනි. | නිෂ්ක්‍රීය, භාවිතයට ගත නොහැකි හා සෙමින් චලනය වන භාණ්ඩ අඩු කිරීමට අපි පියවර ගෙන ඇති අතර, දැන් පවතින භාණ්ඩවල වටිනාකම පෙර වසරවලට සාපේක්ෂව අඩු වී ඇත. ඇණවුම් කිරීමට පෙර ගබඩාවල ඇති තොග ලබා ගැනීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කිරීමට ඒ වන විටත් පියවර ගෙන තිබුණි.<br><br>ඊට අමතරව ගබඩාවල පවතින භාවිතා කළ නොහැකි හා චලනය නොවන භාණ්ඩ හඳුනාගෙන එය නිසි අධිකාරියට වාර්තා කිරීමට කමිටුවක් පත් කරන ලෙස අපි ඉල්ලා ඇත. | භාවිතයට ගත හැකි තත්වයේ පවතින භාණ්ඩ නව ප්‍රසම්පාදනයට පෙර උපරිම ලෙස භාවිතා කළ යුතුය . |

## 3 .7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------------ | -------------- |
| විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකයේ ක්‍රීඩා හා විනෝදාත්මක සංකීර්ණය සැලසුම් කිරීම හා ඉදිකිරීම සඳහා මිලියන 202 ක් ගෙවා ඇති අතර, එහි ඉදිකිරීම් කටයුතු 2017 ඔක්තෝබර් 31 හෝ ඊට පෙර අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එම ඉදිකිරීම් කටයුතු මෙම වාර්තාවේ දිනය තෙක් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | යාපනය දිස්ත්‍රික් ව්‍යාපෘතියේ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය හේතුවෙන් සහ පහත සඳහන් හේතු නිසා 2019.02.28 දක්වා දීර්ඝ කර ඇත.<br>- බොරලු සහ ගඟ වැලි හිඟතාවය<br>- මුල් නිර්මාණයේ වෙනස්වීම් සහ අමතර වැඩ ඇතුළත් කිරීම.<br>- අතුරු ගෙවීම් නිකුත් කිරීම ප්‍රමාද වීම.<br>- අහිතකර දේශගුණික තත්ත්වයන්<br>- ආනයනික සැපයුම්වල අනපේක්ෂිත ප්‍රමාදයන් සහ ශ්‍රමිකයින්ගේ ඌණතාවය. | ඉදිකිරීම් කටයුතු නියමිත වේලාවට අවසන් කළ යුතුය. |

## 3.8 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------------ | -------------- |
| (අ) ලංසු කැඳවනු ලැබූ අයිතම/ වැඩ, සම්පූර්ණ ලංසු ගණන, සාර්ථක ලංසුකරුගේ නම සහ සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කරන ලද රු. 102,255,525 ක කොන්ත්‍රාත්තුව පිළිබඳ විස්තර විශ්වවිද්‍යාලය සිය වෙබ් අඩවියේ හෝ වෙනත් සුදුසු මාධ්‍යයක ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.10.1 ට අනුව විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | කොන්ත්‍රාත් වැඩ පිළිබඳ තොරතුරු විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ 2019.03.20 දින දක්වා විශ්වවිද්‍යාලය විසින් ප්‍රකාශයට පත් කර නොමැති නමුත් මේ වන විටත් විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන තිබේ. අපි ඉදිරියේදී සමීප අධීක්ෂණයන් කරනු ලබන අතර, එය දිගටම අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.3.3 වගන්තියට අනුව, ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයින් දෙදෙනෙකු ලංසු විවෘත කිරීමේදී සහභාගි විය යුතුය. කෙසේ වෙතත්, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය සඳහා දේශන ශාලා සංකීර්ණය ඉදිකිරීම සම්බන්ධ ලංසු විවෘත කිරීමේ කමිටු රැස්වීමේදී එක් සාමාජිකයෙකු සහභාගි වී නොතිබුණි. | මෙම ලංසු විවෘත කිරීමේ දී ලංසු විවෘත කිරීමේ කමිටු සාමාජිකයින්ගෙන් එක් අයෙකු අනෙක් සාමාජිකයා සමඟ ලංසු විවෘත කිරීමේ අවස්ථාවට පැමිණ සිටි අතර, අවශ්‍ය සියලුම ලංසු ලියකියවිලි අත්සන් කළ නමුත් ලංසු විවෘත කිරීමේ සටහනේ අත්සන් කිරීමට අපොහොසත් විය. ඉදිරියේදී මෙවැනි ආකාරයේ දෝෂයන් වළක්වා ගැනීමට අපි පියවර ගෙන ඇත්තෙමු. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය |

## 3. 9 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ පීඨ හතක සහ වෙනත් අධ්‍යයන ඒකකවල මහාචාර්ය, ආශ්‍රිත මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ කථිකාචාර්ය වැනි ප්‍රධාන අධ්‍යයන තනතුරු සඳහා පුරප්පාඩු 207 ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 258 ක් විශ්වවිද්‍යාලය විසින් පුරවා නොමැතිබුණි. තවද, වවුනියා මණ්ඩපයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු 114 ක් පිරවීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන නොතිබුණි. | මෙම අධ්‍යයන නොවන පුරප්පාඩු වලින් බොහොමයක් සුළු ශ්‍රේණියේ සේවකයින් වන අතර උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ලැයිස්තුව මත පදනම්ව ඔහු පුරවනු ලැබේ. දැන් අපට නව අමාත්‍යාංශ ලැයිස්තුව ලැබී ඇති අතර ඒ මත පදනම්ව මාස 2 ක් තුළ පුරප්පාඩු 210 ක් පිරවීමට අපි සැලසුම් කර ඇත්තෙමු.<br><br>අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්පතක් නොලැබුණු හෙයින් මහාචාර්ය තනතුරු 43 ක් පුරවා ගැනීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය. සියළුම පීඨවල ඇතැම් විෂයයන්හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්/ කථිකාචාර්යවරුන්ගේ තනතුර සඳහා පවා එවැනි තත්වයක් පවතී. එවැනි තත්වයන් යටතේ අධ්‍යයන වැඩසටහන් බාධාවකින් තොරව සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල විසින් මෙම පුරප්පාඩු තාවකාලික දේශන, තාවකාලික උපදේශකවරුන් හෝ තාවකාලික නිරූපණකරුවන්ගෙන් (Demonstrators) පුරවා ඇත.<br><br>අනධ්‍යයන සුළු ශ්‍රේණියේ කාර්ය මණ්ඩලය පිරවීම සඳහා අපට අමාත්‍යාංශ ලැයිස්තුව ලැබී ඇති අතර වවුනියා | පුරප්පාඩු ප්‍රමාදයකින් තොරව පිරවිය යුතුය. |

විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිරවීම සඳහා දැනටමත් පියවර ගෙන තිබේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය, සඳහා අපේක්ෂිත සුදුසුකම් හා පළපුරුද්ද සහිත සුදුසු අපේක්ෂකයින් සොයා ගැනීමට අපට නොහැකි විය. එවැනි තත්වයන් යටතේ අධ්‍යයන වැඩසටහන් බාධාවකින් තොරව සිදු කිරීම සඳහා තාවකාලික දේශන, තාවකාලික උපදේශකවරුන් හෝ තාවකාලික නිරූපණකරුවන්ගෙන් (Demonstrators) පුරප්පාඩු වූ තනතුරු පුරවා ඇත.

### 3.10 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 803 ට අනුව විශ්වවිද්‍යාලයේ වාහන සඳහා ලොග් පොත් නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. | වාහන සඳහා ලොග් පොත් නිසි ලෙස නඩත්තු කිරීම සඳහා 2018 අගෝස්තු මාසයේ සිට අප එලදායී පියවර ගෙන ඇත්තෙමු. | වාහන පද්ධතිය නිසි ලෙස නඩත්තු කර අධීක්ෂණය කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 වගන්තිය හා විගණකාධිපතිවරයාගේ අංකය AG/Gen/Sec./2018/82 අනුව, මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත | මෙය විශ්ව විද්‍යාලයේ පාලනයෙන් තොර වූ කාරණයකි. පෙර වර්ෂයේ හඳුන්වා දුන් ස්ථාවර වත්කම් ලේඛනයේ පද්ධති දෝෂයක් තිබේ. මාස 2 කට වඩා වැඩි කාලයක් තිස්සේ පද්ධති සැපයුම්කරුවන්ට දෝෂය නිවැරදි කිරීමට නොහැකි විය. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. කෙසේ | මූල්‍ය ප්‍රකාශන නියමිත වේලාවට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2018 න් අවසන් වර්ෂය සඳහා වූ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 ජුනි 10 දින දීය. | වෙතත්, අපි එම දෝෂය සාර්ථකව නිවැරදි කර 2019 මැයි මස අවසානයේ වාර්තාව අවසන් කර විගණන කමිටුවට ඉදිරිපත් කළෙමු. අනාගතයේ දී මෙවැනි වැරදි වළක්වා ගැනීම සඳහා අපි පූර්වාරක්ෂාව සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, අනාගතයේ දී මූල්‍ය ප්‍රකාශන නියමිත වේලාවට ඉදිරිපත් කිරීමට දැනටමත් පියවර ගෙන තිබේ. | |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2014 හි අවශ්‍යතාවයන්ට අනුකූලව 2018 වර්ෂය සඳහා සකස් කරන ලද උපායමාර්ගික හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ සහ මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබුණි. | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ සහ මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් අනාගතයේදී උපායමාර්ගික හා වාර්ෂික ක්රියාකාරී සැලැස්මට ඇතුළත් කරනු ලැබේ. | උපායමාර්ගික හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රියාකාරකම් ඇතුළත් විය යුතුය. |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර විගණන ඒකකය විසින් පරිත්‍යාග හා විදේශ අරමුදල්, මාණ්ඩලික ණය, මාණ්ඩලික පිරිස් ලිපිගොනු සහ අධ්‍යයන වැඩසටහන් වැනි විගණන වැඩසටහන් 15 න්, 4 ක් (4) | වර්ෂයේ අවසාන කාර්තුවේදී අප අභ්‍යන්තර විගණක නොමැතිව සිටි අතර, 2018 වර්ෂයේ සියලුම පරිච්ඡේද ආවරණය කිරීමට තරම් මානව සම්පත් ප්‍රමාණවත් නොවීය. 2018 ජුනි මාසයේ සිට පමණක් විගණන සහායකයින් අභ්‍යන්තර විගණන අංශයට පත් කර ඇති අතර, තවමත් | ක්‍රියාකාරී සැලැස්ම අනුව අභ්‍යන්තර විගණන වැඩසටහන සම්පූර්ණ කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක කර නොතිබුණි. | නියෝජ්‍ය අභ්‍යන්තර විගණක පුරප්පාඩු ආරවුල සම්බන්ධයෙන් නිරන්තර පසු විපරම් කරමින් පවතී. | |

## 4.4 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැයගත සහ තථ්‍ය ආදායම් සහ වියදම් අතර සියයට 10 සිට 56 දක්වා සැලකිය යුතු විචලනයන් දක්නට ලැබුණු අතර, කළමනාකරණ පාලනයේ ඵලදායී මෙවලමක් ලෙස අයවැය භාවිතා කර නොතිබූ බව පෙන්නුම් කෙරුණි. | මාසිකව මූල්‍ය කමිටුවේදී සහ කාර්තුමය පදනම මත විගණන කමිටුවේදී විචල්‍යතාවයන් සම්බන්ධයෙන් නිරන්තරයෙන් අධීක්ෂණය කිරීමට පරිපාලනය පියවර ගෙන තිබේ. මේ සම්බන්ධයෙන් දැනටමත් පියවර ගෙන ඇති අතර විචල්‍යතාවයන් අවම කිරීම සඳහා ගත හැකි සියලු පූර්වාරක්ෂාවන් ගනු ලැබේ. | කළමනාකරණ පාලනයේ ඵලදායී මෙවලමක් ලෙස අයවැය භාවිතා කළ යුතුය. |